*සැ. යු.* -2018.07.13 දින පළ වූ අංක 2080 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,081 - 2018 ජූලි මස 20 වැනි සිකුරාදා - 2018.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... ... | 1528 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1538 |

*සැ. යු.*-(i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2018 ජූලි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජූලි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික ශිල්පීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු ය.

(අ) පුරවැසිභාවය - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු යි.
(ආ) වයස- 2018.09.28 දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24ට නොවැඩි විය යුතු යි.
(ඇ) උස- අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතු යි.
(ඈ) බර- කිග්‍රෑ. 47 (රාත්තල් 105ට) නොඅඩු විය යුතු යි.
(ඉ) පපුව- අඟල් 32ට නොඅඩු විය යුතු යි.
(ඊ) වර්ණ දෘෂ්ටිය - එස්ටීඩී II
(උ) දෘෂ්ඨී තීක්ෂණත්වය - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව)
(ඌ) සිවිල් තත්වය - අයදුම්කරුවන් අවිවාහක විය යුතු යි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ.

3. අධ්‍යාපන සුදුසුකම් :

(අ) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නාවික ඉංජිනේරු)
(2) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(3) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි ඉංජිනේරු)
(4) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ස්වයංචලන ඉංජිනේරු)
(5) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අළුත්වැඩියාවන් සහ නැව් ඉදිකිරීම්)

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු ය. තව ද, අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් එක් වරක දී සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව සමත් වී තිබිය යුතු ය. (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.)
සටහන - අ.පො.ස. (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකනු නොලබන අතර, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

4. ඉහත 2 සහ 3 ඡේදයෙන් දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

5. සේවා කොන්දේසි :

(අ) අපේක්ෂකයින් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

(ආ) පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන් පසුව ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඇ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් උපකරණ සපයනු ලැබේ.

(ඈ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව තුළින් සපයනු ලැබේ.

(ඉ) පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඊ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය

නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතු යි.

(උ) සියලුම නාවිකයින් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

6. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා* : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

7. *වැටුප් හා දීමනා* :

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව-

(අ) මූලික වැටුප - රු. 20,798.00
(ආ) ජීවන වියදම් දීමනාව - රු. 7,800.00
(ඇ) නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව - රු. 170.00
(ඈ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) - මූලික පුහුණුවෙන් පසු හිමි වේ.
(ඉ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) - මූලික පුහුණුවෙන් පසු හිමි වේ.
(ඊ) අනෙකුත් දීමනා - විශේෂ දීමනාව රු. 1,000.00
- විශේෂ අමතර දීමනාව රු. 2,400.00
(උ) ගැළපුම් දීමනාව - රු. 9,822.00
සම්පූර්ණ වැටුප අවම වශයෙන් - රු. 38,876.00

***සටහන*** : නාවිකයාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු. 30,140.00 වන අතර, වැටුප් වර්ධකයන් පහත පරිදි වැටුප් වර්ධකයන් හිමි වේ.

2016.01.01 - 176x5 - 210x19
2020.01.01 - 300x5 - 370x19

(ඌ) නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට කාලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(එ) කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ඒ) නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට ළමයින්ට සහ යැපෙන්නන්ට)

(ඔ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු. 1,600.00 සිට රු. 3,300.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

(ඕ) විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

8. *අයදුම්කරුවන්ට උපදෙස්* :

(අ) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතු යි. ඉල්ලුම්පත් 2018 සැප්තැම්බර් මස 28 වැනි දින 1200 පැයට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙළවරේ "ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම" යනුවෙන් සටහන් කළ යුතු යි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215162 මගින් ලබා ගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරාගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය;
(2) අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය;

(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(6) මෑතක දී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිට වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතු ය;

(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

(9) ඉල්ලුම්පතහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

(10) තෝරා ගැනීමේ/සම්මුඛ පරීක්ෂණ ආදිය.

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. එම පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වන්නේ ය.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා.

| ව්‍යායාමය | කාලය (මිනිත්තු/තත්පර) | වාර ගණන |
|---|---|---|
| මීටර් 1600 දිවීම | මිනිත්තු 07 තත්පර 30 | - |
| Push Up | මිනිත්තු 02 | වාර 20 ක් හෝ ඊට වැඩි |
| Sit Up | මිනිත්තු 02 | වාර 15ක් හෝ ඊට වැඩි |
| Arm Bending | මිනිත්තු 02 | වාර 07ක් හෝ ඊට වැඩි |

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(ඈ) මෙම තනතුර සම්බන්ධනේ අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඊ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කල යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේ ය.

(උ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

*සටහන* - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

එස් එස් රණසිංහ, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, වීඑස්වී,
යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, ඒම්ඩබ්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයින් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)
2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.
3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————.
5. ස්ථිර ලිපිනය :————.
6. තැපැල් ලිපිනය :————.
7. උපන් දිනය :————.
8. වයස අවුරුදු :————. මාස :————. දින :————. (2018 සැප්තැම්බර් මස 28 දිනට)
9. උස :————. (අඟල්) පපුව :————. (අඟල්) බර :————. (කි.ග්‍රෑ.)
10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
11. දිස්ත්‍රික්කය :————.
12. ඡන්ද කොට්ඨාසය :————.
13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
14. දුරකථන අංකය :————.
15. විවාහක හෝ අවිවාහක බව :————.
16. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
17. අධ්‍යාපනය ලැබූ පාසල් :————.
18. පාසල සහ හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ / විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ. පො. ස. (සා.පෙළ)<br>අ. පො. ස. (උ.පෙළ)<br>වෙනත් | | |

19. පාසලෙන්/ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියාව පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා<br>මව | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

23. පාසලේදී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදු වූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ ඇඟ බැඳ තිබේද? එසේනම් විස්තර සඳහන් කරන්න :————.

27. රජයේ දෙපාර්තමේන්තුවකදී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාල වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

07-625

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආරක්ෂක අමාත්‍යාංශය

### ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර (විධායක නිලධර ගණයේ විශේෂ ශ්‍රේණිය) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය*.- නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා බඳවා ගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණුදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :-

(i) අධ්‍යාපන සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම හා ඉංජිනේරු විද්‍යාව/තොරතුරු තාක්ෂණය යන තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයකින් ශාස්ත්‍රපති/විද්‍යාපති පශ්චාත් උපාධියක් ලබාතිබීම.

(ii) පළපුරුද්ද :

(*අ*) රජයේ නිලධාරීන් සඳහා -

විධායක නිලධර ගණයේ I ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව වසර දහඅට (18)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම සහ සුදුසුකම් පරීක්ෂාකරනු ලබන දිනට පූර්වාසන්න වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම;

හෝ

(*ආ*) යුද්ධ හමුදාවේ මේජර් ජනරාල් හෝ එම නිලයට සමාන්තර සන්නද්ධ සේවාවක තනතුරක නිලධාරියකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

(iii) වෘත්තීය සුදුසුකම් :
වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම්, එවැනි සුදුසුකම් අමතර සුදුසුකමක් සේ සැලකේ.

(iv) කායික සුදුසුකම් :
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් සුදුසුකම් :
සෑම ඉල්ලුම්කරුවෙක්ම,

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(*ආ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(*ඇ*) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුර බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රු. 88,000 - 2700 x 12 -රු. 1,20,400/- මාසික වැටුප් පරිමාණයක් හිමිය.

(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL - 03 -2016 වැටුප් බණ්ඩය)

06. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | විෂය | ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද ප්‍රථම උපාධිය<br>➢ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>➢ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>➢ දෙවන පන්තියේ පළමු සාමාර්ථයක් සඳහා<br>(ආ) ඉංජිනේරු විද්‍යාව/ තොරතුරු තාක්ෂණය යන තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයකින් ශාස්ත්‍රපති/ විද්‍යාපති පශ්චාත් උපාධියක් ලබා තිබීම | 10<br>07<br>03<br><br>10 | 20 |
| 02 | වෘත්තීය සුදුසුකම් :<br>➢ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හෝ වෙනත් පිළිගත් ඉංජිනේරු ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම | 20 | 20 |
| 03 | අතිරේක පළපුරුද්ද :<br>(අ) රජයේ නිලධාරීන් සඳහා,<br>➢ විධායක නිලධර ගණයේ I ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව වසර 18කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (I ශ්‍රේණියේ වසර 05කට වඩා වැඩිවන සෑම වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 06කට)<br><br>(ආ) හමුදාගත නිලධාරීන් සඳහා,<br>➢ යුද්ධ හමුදාවේ මේජර් ජනරාල් හෝ එම නිලයට සමාන්තර සන්නද්ධ සේවාවක තනතුරක නිලධාරියකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම. (වසර 05කට වඩා වැඩිවන සෑම වසරකට ලකුණු 05 බැගින් උපරිම වසර 06කට) | 30<br><br>30 | 30 |
| 04 | කාර්ය සාධනය හා කුසලතාවයන්<br>➢ විශිෂ්ඨ<br>➢ සතුටුදායක<br>➢ සාමාන්‍ය | 05<br>03<br>02 | 25 |

| | විෂය | ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය<br>➢ නායකත්වය<br>➢ සන්නිවේදනය<br>➢ පෞරුෂත්වය | <br>02<br>02<br>01 | 05 |
| | මුළු එකතුව | | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්පත් 2018.08.21 දින හෝ එදිනට ප්‍රථම ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් 02 වන පිටුව අංක 06 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.
(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම් කිරීම"යනුවෙන් සඳහන් කළ යුතුය.
(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 47,615/- ක මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.
(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටතුව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.
2018 ජූලි මස 15 වැනි දින.

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත

01) 1.1 මුලකුරු සමග නම :- Mr./Mrs./Miss :——————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම :——————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :——————————.
(සිංහලෙන්)

02) 2.1 ස්ථිර ලිපිනය :——————————.

2.2 දුරකතන අංකය :——————————.

ස්ථාවර :——————————. ජංගම :——————————.

03) 3.1 ජනවර්ගය : [ ] සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 4, වෙනත් - 5

3.2 ස්ත්‍රී/ පුරුෂ භාවය :

| | |
|---|---|
| | |

3.3 විවාහක/ අවිවාහක බව :

| විවාහක | | අවිවාහක | |
|---|---|---|---|

3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

3.5 උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

3.6 2018.08.21 දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.

04) 4.1 අධ්‍යාපන සුදුසුකම් :

4.1.1. ප්‍රථම උපාධිය

(i) උපාධිය බලපැවැත්වෙන දිනය :—————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :—————.
(iii) උපාධිය :—————.

4.1.1. ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධිය

(i) උපාධිය බලපැවැත්වෙන දිනය :—————.
(ii) විශ්වවිද්‍යාලය/ආයතනය :—————.
(iii) උපාධිය :—————.

4.2 පළපුරුද්ද :—————.

4.2.1 රජයේ නිලධාරීන් සඳහා —
(අ) සම්පූර්ණ සේවා කාලය :—————.
(ආ) පළමු පත්වීමේ දිනය :—————.
(ඇ) විධායක නිලධර ගණයේ I ශ්‍රේණියට පත් වූ දිනය හා සේවා කාලය :—————.

4.2.2 යුද්ධ හමුදාවේ මේජර් ජනරාල් හෝ එම නිලයට සමාන්තර සන්නද්ධ සේවාවක තනතුරක නිලධාරියකු නම්,

(අ) එම නිලයට පත් වූ දිනය :————.

(ආ) එම නිලයෙහි සේවා කාලය :————.

05) යම්කිසි සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලබා තිබේ ද? එසේ නම් දිනය හා නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සපයන්න.

06) අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

07) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 571,380/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................... (සම්පූර්ණ නම) මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් .................................. දින ඔහුගේ/ ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

| | |
|---|---|
| දිනය | :——————————. |
| අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම | :——————————. |
| තනතුර | :——————————. |
| ලිපිනය | :——————————. |

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

08) ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් .................................. දින ඔහුගේ/ ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

ඔහුගේ/ ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම ............................................ බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකිය/ නොහැකිය.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන)

දිනය :——————————.
නම :——————————.
තනතුර :——————————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

07-975

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

### නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරි තනතුරු (එම්. එන් 03 - 2016) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තාක්ෂණ තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සංඛ්‍යාව - 03

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ පුරප්පාඩු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

03. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

සහ

(*ආ*) ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යාව/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ. පො. ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම.

*වෘත්තීය සුදුසුකම් :*

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(v) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. *කායික සුදුසුකම්.*-සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

05. වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(iv) තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. *වයස*.-අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන්දිනය 2000.08.20 දින හෝ ඊට පෙර හා 1988.08.20 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි).

07. බඳවා ගැනීමේ ක්‍රමය - ලිඛිත විභාගය :
විභාගය පැවැත්වීමට නියමිත ස්ථානය හා මාසය - කොළඹ නගරය
විභාගය පැවැත්වීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයන් ලෙස සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් එකක් තෝරා ගතයුතු අතර අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම සඳහා අවස්ථාව ලබා නොදෙනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය පැය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ, තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තීන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | 01 | 100 | 40 |
| විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය | ගොඩනැගිලි ඉදි කිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්යය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ හැකියාව, ජල සැපයීම, ජලප්‍රවාහන, ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳ අපේක්‍ෂකයා සතු අත්පත් කරගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. | 03 | 100 | 40 |

ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

08. *වැටුප් පරිමාණය* :

රුපියල් 31,040-445x10-660x11-730x10-750x10-රු. 57,550
එම් එන් -3-2016 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව)

09. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-
- බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
- පත් කරනු ලබන තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි.

10. මෙම නිවේදනයේ නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

12. (1) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(11) මෙම නිවේදනයේ 07 ඡේදය අනුව එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලැබූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ www.results.exam.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම මගින් ප්‍රතිඵල දන්වනු ඇත.

13. අයදුම් කළයුතු ක්‍රමය :

(අ) ආදර්ශ අයදුම්පත්‍රය විභාග නිවේදනයට අමුණා ඇති අයදුම්පත්‍ර ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනය ගනිමින් සැකසිය යුතු අතර අයදුම්පත්‍රයේ පළමු පිටුව සඳහා අංක 01 සිට 05 දක්වා ශීර්ෂත්, අංක 6 සිට ඉදිරියට ශීර්ෂ පිළිවෙලින් අනෙකුත් පිටු වලටද ඇතුළත්වන පරිදි අයදුම්පත්‍රය පිළියෙල කලයුතුවේ. එහි ශිර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට ද අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුවේ. මෙම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට ඇත් ද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ.

අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (එම් එන් - 03) සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම විවෘත තරග විභාගය - 2018'' යනුවෙන් සඳහන් කර 2018.08.20 දිනට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.08.20 වේ.

(ඇ) විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

(ඈ) විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ලැබේ :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත්කළ ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගයට පෙනී සිටින පළමු දිනයේම එහි ශාලාධිපතිට භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. අත්සන සහතික කිරීම :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරි සේවයේ/රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු, හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කර ගත යුතුය. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටි නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළයුතුය.

*සැලකිය යුතුයි.-*

* අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳව සහතික විය යුතුය.

* ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයන්ට අදාළවන සියලුම නීති රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධනය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය මගින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

* තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍රලේඛයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

ඉංජි. (ආචාර්ය) පොන්නයියා සුරේෂ්,
ලේකම්.

නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා
හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.
2018 ජූලි මස 02 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

**නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුගත තාක්ෂණ නිලධාරි තනතුරු (එම් එන් 03 2016) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to the Post of Departmental Technical Officer (MN03-2016) of Ministry of Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs - 2018

පදිංචි දිස්ත්‍රික්කය : [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල -2
දෙමළ -3 [ ]
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ලිපිනය (රාජකාරි) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 ලිපිනය (රාජකාරි) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.5 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නියුක්ත නිලධාරියකු ඔහුගේ රාජකාරි ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දන්විය යුතුය.)

03. ස්ත්‍රී/පුරුෂභාවය : [ ] ස්ත්‍රී - 1
පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න.

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

05. 5.1 උපන් දිනය :

වර්ෂය | | | | |  මාසය | | |  දිනය | | |

5.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු | | | | |  මාස | | |  දින | | |

06. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

07. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පෙදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

(ඇ) වෘත්තිය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද :————.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
 (i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
 (ii) ලදුපත් අංකය හා දිනය :————.
 (iii) ගෙවූ මුදල :————.

| රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

09. අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

11.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදයකය/අසතුටුදයකය, සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත. කිසිදු විනය දඬුවමකට ලක්වී නැත/ඇත.

11.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදහැරිය හැකිය/නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

07-512

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 නොවැම්බර් මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය යථා කාලයේ දී පුවත්පත් මඟින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

02. යෝග්‍යතාවය ඃ

(i) සෑම අයදුම්කරුවකුම ඔහු / ඇය ඃ-

(*අ*) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,

(*ආ*) විශිෂ්ට චරිතයකින් යුතු අයකු බවත්,

(*ඇ*) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 28 ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂිවලින් ඔප්පු කළ යුතුය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1996.08.20 දින හෝ ඊට පෙර හා 1990.08.20 හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

***සටහන*** - යම් ආගමික නිකායක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

(ii) *ශාරීරික යෝග්‍යතාවය*.- පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව (ප්‍රසාරණය කළ විට) අඟල් 33 ට නොඅඩු විය යුතුය.

අයදුම්කාරිනියන්ගේ උස අඩි 5 අඟල් 3ට නොඅඩු විය යුතුය.

(iii) *අධ්‍යාපන සුදුසුකම්*.- සෑම අයදුම්කරුවකුටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(*අ*) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්;

සහ

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විෂයයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් (වෛකල්පිත සාමර්ථ්‍ය අදාළ නොවේ);

හෝ

අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා තිබීම.

*සටහන*.-උපාධියකට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිම අයකුට මෙම විභාග යට පෙනී සිටීමට නොහැක. කෙසේ වුවද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත් වූ අයකුට ඔහු/ඇය එම උපාධි විභාගය සමත් වූ බවට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් ලබා ගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට අවසර දිය හැකිය.

03. සේවා කොන්දේසි ඃ

(i) *වැටුප* - මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි අනුව වැටුප් ක්‍රමය - MN - 5 දරන වැටුප් කාණ්ඩයේ, රු. 34,605 - 660 x10 - 755 x 11 - 930 x 15 = රු. 63,460වන අතර (2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි සඳහන් විධිවිධාන අදාළවේ.)

(ii) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්විය යුතුය.

(iii) තෝරාගත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iv) පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද, නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(v) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේ දීම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන්ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතුය.

(vi) මෙම *ගැසට්* පත්‍රයේ 1 වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. *විභාග පරිපාටිය*.-බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (01) | අභියෝග්‍යතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 1/2යි) | ලකුණු 100 යි |
| | **එකතුව** | ලකුණු 200 යි |

***අභියෝග්‍යතාව ප්‍රශ්න පත්‍රය***.- මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ භාෂා ප්‍රවීණත්වය හා

තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය.*-අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

***සටහන.***-මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම නිවේදනයේ 02(III) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) නොපැහැදිළි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(ii) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ට / අයදුම්කාරිනියන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය.

(iii) ***ඇගයීමේ ක්‍රමය.***-තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 60% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහිදී ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලබන අතර, පසුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද යොමු කෙරේ. එහිදී අයදුම්කරුවන්ට ලකුණු ලබාදීමක් සිදු නොවන අතර, සුදුසුකම් පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරුවල සත්‍යතාව වැනි කරුණු මෙහිදී පරීක්ෂා කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල :-

කලාප මට්ටම් ක්‍රීඩා තරග ප්‍රථම ස්ථානයට ලකුණු 3යි. දෙවන ස්ථානයට ලකුණු 2 යි. තුන්වන ස්ථානයට ලකුණු 1යි.

දිස්ත්‍රික් මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 4යි. දෙවන ස්ථානයට ලකුණු 3 යි. තුන්වන ස්ථානයට ලකුණු 2යි.

ජාතික මට්ටමේ දී ප්‍රථම ස්ථානයට ලකුණු 5යි. දෙවන ස්ථානයට ලකුණු 4 යි. තුන්වන ස්ථානයට ලකුණු 3යි.

කලාප තරගවල දී කණ්ඩායමක සාමාජිකයකු හට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු නම් ලකුණු 3 යි. දෙවන ස්ථානයට ලකුණු 2යි. තුන්වන ස්ථානය සඳහා ලකුණු 1 බැගින් ලබා දෙනු ලැබේ.
දිස්ත්‍රික් තරගවලදී කණ්ඩායමක සාමාජිකයකු හට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු නම් ලකුණු 4 යි. දෙවන ස්ථානය සඳහා ලකුණු 3යි. තුන්වන ස්ථානය සඳහා ලකුණු 2 බැගින් ලබා දෙනු ලැබේ.

ජාතික මට්ටමේ තරගවලදී කණ්ඩායමක සාමාජිකයකු හට පළමු ස්ථානය දිනූ කණ්ඩායමක සාමාජිකයකු නම් ලකුණු 5 යි. දෙවන ස්ථානයට ලකුණු 4යි. තුන්වන ස්ථානය සඳහා ලකුණු 3 බැගින් ලබා දෙනු ලැබේ.

05. *තෝරා ගැනීමේ පදනම.*- ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ බඳවාගැනීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, ඒකාබද්ධ නිලධරසංඛ්‍යාවේ කාන්තා පුරප්පාඩු සංඛ්‍යාව අනුව 10%කට නොවැඩි ප්‍රමාණයක් අයදුම්කාරියන් සඳහා වෙන් කෙරේ.

05. (i) *ප්‍රතිඵල නිකුත් කිරීම.*- ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ ලිඛිත අයදුම්කරුවන්ගේ විභාග ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුව මත ප්‍රමුඛතාවය අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල් ,ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

***සටහන*** : රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරී ස්වභාවය අනුව නිලධාරිනියන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන් හී සේවය කිරීමට සිදුවනු ඇත.

06. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. ඉල්ලුම් කිරීමේ පිළිවෙල :

(i) *ආදර්ශ අයදුම්පත* - මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන්ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් පිරවිය යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතුය. (ආදර්ශ අයදුම් පත්‍රයේ අංක 01 සිට 05

තෙක් 1 වන පිටුවට ද, 06 සිට 11 තෙක් දෙවන පිටුවේ ද ඉතිරිය තුන්වන පිටුවට ද වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න) ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේ දී විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකුල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කොට තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිවත් වන්න.

(ii) අයදුම්පත් 2018.08.20 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

(iii) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750/- ක මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නො ලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකරනු ඇත. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතා යෝග්‍ය වේ.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. 2018.08.20 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය. දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

(v) *සහතික කිරීම* .- දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු , නීතිඥයකු, නොතාරිස් කෙනකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියකු , වාර්ෂිකව රුපියල් 240,360/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු , අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතුය.

08. (i) විභාග ප්‍රවේශ පත්‍ර - *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාගකොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවකු වේනම් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ නම,ලිපිනය,ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම් කරුවකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ.එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රයේ පිටපත,විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) *විභාගයට ඇතුළත් කර ගැනීම*.- විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.විභාග යට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත

තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අයදුම්කරුවකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත.මෙම *ගැසට්* පත්‍රයේ පළමුවැනි කොටස (II අ) ඡේදයෙහි විභාග අයදුම්කරුවන් සඳහා සකස් වූ ව්‍යවස්ථා පළකොට ඇත. විභාග අයදුම්කරුවන් මෙම ව්‍යවස්ථා පිළිපැදීමට බැඳී සිටිති.

(iii) අයදුම්පත්‍ර ලැබුණ බව අයදුම්කරුට දන්වනු නොලබන අතර,විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* : විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවකු විභාග යට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

09. *අනන්‍යතාව.*-අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. සුදුසුකම් පිළිබඳ ලියවිලි:

(i) අයදුම්පත සමග මුදල් තැන්පත් කළ ලදුපත හා අදාළ වේ නම්, ශීර්ෂ අංක 02 හි'සටහන' යටතේ දක්වා ඇති අවශ්‍යතාව සඳහා වූ ලේඛනය හැර සහතික පත්, ඒවායේ ඡායා පිටපත් හෝ වෙනත් කිසිදු ලිපිලේඛනයක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(*අ*) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්,

*සටහන.*- එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ වාර්ෂිකව රුපියල් 240,360/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුවද ලබා ගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතුය. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

(*ආ*) අයදුම්කරුවන්ගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

*සටහන්* :

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර උද්ධෘත භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අයදුම්කරු/අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු/ඇය විභාගයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසිබවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි)

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් එනම්,අයදුම්කරු උපාධි විභාගය සමත් බවට විශ්ව විද්‍යාලයක ලේඛකාධිකාරි විසින් නිකුත් කරන ලද නිල ලියවිල්ලක් හා විභාග දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, ඉංග්‍රීසි භාෂාවට

සාමාන්‍ය සාමර්ථයක් සහිතව සමත් වූ බවට නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය;

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවලදී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන.

(vi) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අයදුම්කරුවකු වෙතොත් ඔහු මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* - මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීම නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපයා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙකදී සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම් පත්‍රය

***ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018***

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO POSTS OF ASSISTANT SUPERINTENDENT OF CUSTOMS, GRADE II OF SRI LANKA CUSTOMS DEPARTMENT - 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :————.

02. ස්ථිර පදිංචි ලිපිනයඃ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත පිළිබඳ විස්තර ඃ

3.1 හැඳුනුම්පත් අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 නිකුත් කළ දිනය ඃ ☐

04. ස්ත්‍රී පුරුෂ භාවය ඃ

පුරුෂ - 0 ☐
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. උපන් දිනය ඃ

(අ) අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) ඉල්ලුම් පත් භාර ගන්නා
අවසාන දිනට වයස ඃ

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ ඃ

පරම්පරාවෙන් - 1 ☐
ලියාපදිංචියෙන් - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න )

07. ජනවර්ගය ඃ
සිංහල - 1
ලංකා දෙමළ - 2 ☐
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න )
බර්ගර් - 5
වෙනත් - 6

08. ජංගම දුරකථන අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐

09. ශාරීරික යෝග්‍යතාවයඃ

(i) උස ඃ අඩි :————. අඟල් :————.

(ii) පපුව (ප්‍රසාරණය කළ විට) ඃ අඟල් :————.
(පිරිමි අයදුම්කරුවන්ට පමණයි)

10. ඔබ කවදා හෝ උසාවියකින් වැරදිකරුවෙකු වී තිබේද? ඔව්/නැත
"ඔව්" නම් විස්තර සඳහන් කරන්න :————.

11. *අධ්‍යාපන සුදුසුකම් :*

| *විශ්ව විද්‍යාලයේ නම* | *උපාධිය* | *උපාධියේ පංතිය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(i) අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමර්ථය : ☐
වර්ෂය ...................................
විභාග අංකය ...................................

(ii) අ.පො.ස. (උ.පෙ.) ඉංග්‍රීසි විෂයයට ලබා ඇති ඉහළම සාමර්ථය : ☐
වර්ෂය ...................................
විභාග අංකය ...................................

12. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතුය)

(i) ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

(ii) ගෙවූ මුදල :————. (iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපතේ අංකය :————.

(මෙහි සඳහන් විස්තර අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතුය)

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

13. ***අයදුම්කරුගේ ප්‍රකාශය / සහතිකය :***

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කර තිබෙන සියලු විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න) :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................................... නමැති මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු /ඇය ..................... මස ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, *නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්* මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.

ලිපිනය :————.
(නිල මුද්‍රාව)
දිනය :————.
***සටහන*** : අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 7(v) ඡේදයේ සඳහන් පරිදි ය.

15. *ආයතන ප්‍රධානියාගේ නිර්දේශය* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු වන අතර, ඔහු/ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
සේවා ස්ථානයේ ලිපිනය :————.

07-619

---

**ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගයට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුරේ ස්වභාවය :
මැනුම් කටයුතුවලට අදාළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම සහ සේවා කිරීම.

2. (i) පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර :

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100% | 40% |

(ii) මෙම ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව මත තේරීම් කරනු ලැබේ.

3. බඳවා ගැනීමේ ශ්‍රේණිය :
මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරේ III ශ්‍රේණිය

4. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරා ගනු ලබන නිලධාරින් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම *ගැසට් නිවේදනය* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයේ පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

5. වැටුප් පරිමාණය :
MT1-2016 රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890
* මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වන අතර, රා. ප. ච. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු. 29,840 |
| II | පියවර 12 | රු. 33,190 |
| I | පියවර 23 | රු. 37,250 |

6. වයස් සීමාව :
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, වයස 35ට නොවැඩි විය යුතුය.

7. අධ්‍යාපන සුදුසුකම් :

1. සුදුසුකම්
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව එක් වරක දී විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවකින් විෂයයන් තුනකින් සමත් වී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);

සහ

රජය විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයකින් පිරිනමනු ලබන ක්ෂේත්‍රයට අදාළ වසරක පාඨමාලාවක් හදාරා තිබීම;

හෝ

2. සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව එක්වරක දී විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

රජය විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ NVQ 04 මට්ටම පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම;

හෝ

3. සුදුසුකම් :
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව එක්වරක දී විෂයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

රජය විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයකින් පිරිනමනු ලබන ක්ෂේත්‍රයට අදාළ වසරක පාඨමාලාවක් හදාරා තිබීම.

(සටහන-1 හා 2 සුදුසුකම් කාණ්ඩය යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් ඉහත 1 හා 2 හි දක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසු ඉතිරිව ඇති පුරප්පාඩු සඳහා 3 සුදුසුකම් කාණ්ඩය යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ලබයි.)

8. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මත පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

9. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර :

(*අ*) (i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසාගත යුතු අතර ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 04 දක්වාත්, 02 වන පිටුවේ අංක 05 සිට 09 දක්වාත්, 03 වන පිටුවේ අංක 10 සිට 12 දක්වාත් ඡේදයන් ඇතුලත් විය යුතු අතර, විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර - විවෘත'' යනුවෙන් සඳහන් කර 2018.08.20 දින හෝ ඊට පෙර මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතු ය.)

(ii) අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

(iv) මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

(v) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(*ආ*) ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව වෘත්තීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

11. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක්
(iv) චරිත සහතික දෙකක්

*සැලකිය යුතුයි.*-අධ්‍යාපන, වෘත්තීය හා උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

12. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වුවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

13. විභාග ගාස්තුව රු. 800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතුය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

14. *විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන*
ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

15. *විභාගයට ඇතුලුවීම* :
අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන.*- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

16. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාග ශාලාවේදී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.
(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය

17. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එහි සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

18. *භාෂා මාධ්‍යය* :
මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

19. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2018 ජූලි මස 05 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

***ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය***

*ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 සඳහා ආදර්ශ අයදුම්පත*

Specimen Application form for the open Competitive Examination for recruitment to the Post of Survey Instrument Technician Grade III - 2018 in the Department of Survey

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද ඇතුලත් කළ යුතුය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B. C.

1.2 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය (තිබේනම්) :————.

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 පදිංචිව සිටින කාල සීමාව :————.
3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4.0 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
2018 . . . . . . වැනි දිනට වයස : අවු. :————. මාස :————. දින :————.

5.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
5.1 අ.පො.ස. (සා.පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ. පො. ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵලය :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.0 වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
 6.1 හදරා ඇති පාඨමාලාව :————.
 6.2 පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
 6.3 පාඨමාලාවේ කාලය :————.

7.0 වෙනත් සුදුසුකම් :————.

8.0 ඔබ කවරදක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් ☐ නැත ☐

''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න :————.

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල : රු. :————.

විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තව ද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.
(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............... මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි)

12.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන වල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ................................ මයා/මිය/මෙය ......... දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......... දින සිට ......... දින දක්වා ......... වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය .................. තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

07-647

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.